# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

## ගංවතුරෙන් බලපෑමට ලක් වූ තේ ඉඩම් සහ තේ පැළ තවාන් නැවත නගා සිටුවීම සඳහා වූ උපදෙස් මාලාව

නිකුතුව: 2025 දෙසැම්බර් මාර්ගෝපදේශ අංක: 02/2025

ඇදහැළුණු අධික වර්ෂාපතනයන් සමඟ දිවයිනේ විවිධ තේ වගා කලාපවල ඇතැම් තේ ඉඩම්වලට ස්වභාවික ආපදාවක් ලෙස ගං වතුර තත්වයක් උද්ගත විය. මෙ මඟින්, තේ වතු විවිධ පරිමාණයෙන් ජල ගැලීමට ලක් වූ අතර ඇතැම් ඉඩම්වල දින ගණනාවක් ජලය රැඳී පැවතිණි. මෙමඟින්, එම තේ ඉඩම් විවිධ පරිමාණයෙන් හානියට පත්ව ඇත. මෙම තත්වය කඩිනමින් මඟ හරවා ගෙන එම තේ ඉඩම් නැවත යථා තත්වයට පත්කර ගැනීමට පහත උපදෙස් අනුගමනය කරන ලෙස දැනුම් දෙමි.

### 1. ගං වතුරෙන් හානිවූ තේ තවාන් සඳහා:

#### 1.1. ක්ෂණික ක්‍රියාමාර්ග:

1. පත්‍රවල තැන්පත්ව ඇති රොඩු සහ රොන් මඩ හැකිතාක් දුරට පිරිසිදු ජලයෙන් සෝදා ඉවත් කිරීම.
2. ජල වහනය දියුණු කිරීම සඳහා තවාන් පාත්ති අතර කාණු වල එකතු වී ඇති පස් රොඩු ආදිය ඉවත් කර, කාණු පද්ධතිය ක්‍රමවත් කර, තවාන් භූමියේ ඇති ජලය හැකිතාක් දුරට බැස යාමට ඉඩ සලසා දීම.
3. තේ පැළවල පාදස්ථයේ කඳ වටා එකතු වූ රොන් මඩ හෝ වෙනත් කොළ රොඩු ඇත්නම් ඒවා ඉවත් කර පැළ පාමුල පිරිසිදු කිරීම.
4. අඩක් ඉදිරුනු තේ තවාන් පැළ ඇත්නම් ඒවා නැවත ස්ථාපනය කර අවශ්‍ය ආධාරක සවි කිරීම.

#### 1.2. මධ්‍යකාලීන ක්‍රියාමාර්ග:

1. ද්විතීක දිලීර ආසාධන වැළැක්වීම සඳහා තේ වගාව සඳහා නිර්දේශිත සංස්ථානික දිලීර නාශකයක් යෙදීම.
2. මීට අමතරව, එම තවාන් පැළ නැවත ඇසිරිය හැකි තත්වයක පවතීනම් නම් එම පැළ ජල ගැල්මට ලක් නොවූ උචිත භූමියක නැවත ඇසිරිය හැකිනම් වැදගත්ය.

### 2. ගං වතුරෙන් හානිවූ තේ ඉඩම් සඳහා:

#### 2.1. ක්ෂණික ක්‍රියාමාර්ග:

1. දළු තලයේ හා නඩත්තු පත්‍රවල තැන්පත්ව ඇති රොඩු සහ රොන් මඩ හැකිතාක් දුරට පිරිසිදු ජලයෙන් සෝදා ඉවත් කිරීම.
2. දින 2 කට වඩා ජලයෙන් යටවී තිබුණු තේ පඳුරු සති 2 ක් වත් දළු නොකඩා විවේක ගැන්වීම.
3. ජල වහනය දියුණු කිරීම සඳහා කාණු වල එකතු වී ඇති පස් රොඩු ආදිය ඉවත් කර, ඉඩමේ කාණු පද්ධතිය ක්‍රමවත් කර ඉඩමේ ඇති ජලය හැකිතාක් දුරට බැස යන ආකාරයට ඉඩ සලසා දීම.
4. තේ පඳුරුවල පාදස්ථයේ කඳ වටා එකතු වූ පස්, රොන් මඩ හෝ වෙනත් කොළ රොඩු ඇත්නම් ඒවා ඉවත් කර පඳුර පාමුල පිරිසිදු කිරීම. (මෙහි දී, තේ මුල් නිරාවරණය නොවීමට වගබලා ගතයුතුය).
5. ඉඩමට හොඳින් සූර්යාලෝකය ලැබීම සඳහා මධ්‍යම සෙවන ශාක කප්පාදු කිරිම හා ඉඩමේ ඇති වඳුල ඇති ස්ථාන ඉවත් කිරීම.
6. අඩක් ඉදිරුනු පඳුරු ඇත්නම් ඒවා නැවත ස්ථාපනය කර අවශ්‍ය ආධාරක සවි කිරීම.

7. දළු නෙලීම
    i. දැනට දළු තලයේ හොඳින් වැඩුනු දළු ඇත්නම් එම දළු කඩා සුදුසු දළු (කුණු වී නොමැති සහ රොන්මඩ නොමැති දළු) පමණක් කර්මාන්ත ශාලාවට ලබා දීම.
    ii. තේ පඳුරු ඉහත 2 හි දක්වා ඇති පරිදි විවේක ගැන්වීමෙන් අනතුරුව දළු රවුම් 3ත් පමණ යනතුරු සැහැල්ලු දළු නෙලීමක් සිදු කිරීම.

**2.2.මධ්‍යකාලීන ක්‍රියාමාර්ග:**

1. ද්විතීක දිලීර ආසාධන වැළැක්වීම සඳහා තේ වගාව සඳහා නිර්දේශිත සංස්ථානික දිලීර නාශකයක් යෙදීම. මෙලෙස දිලීර නාශක යෙදූ පසු සති දෙකක්වත් පෙර අස්වනු කාලයක් පවත්වා ගත යුතුය (තේ වගාව සඳහා නිර්දේශ කර ඇති දිලීර නාශක PU 1 උපදෙස් චක්‍රලේඛයේ දක්වා ඇත. - මාත්‍රාව 0.2% - දිලීර නාශක මිලි ලීටර් 20 වතුර ලීටර් 10 මිශ්‍රකර).
2. තේ පඳුරේ අතු කැඩී හෝ වෙනත් යාන්ත්‍රික හානි සිදු වී ඇත්නම් කණ්ඩාසන් හෝ 15% බ්‍යුනෝලියම් වැනි ආලේපනයක් (wound dressing) භාවිතා කරන්න.
3. නෙරයක් හැර නෙරයක් සැහැල්ලු ලෙස මුල්ලු කරන්න. (මෙහිදී පස පෙරලීමක් නොකරන අතර, පසේ සිදුරු සැකසීම පමණක් ඉටු කෙරේ).
4. වසර 5ට අඩු තේ වගාවන් සඳහා 10% - 20% ක සාන්ද්‍රණයකින් යුත් හුණු දියර කඳේ රාමුවට ඉසින්න.
5. කළු පැහැයට හැරී ඇති කුඩා අතු බොහෝ දුරට යළි ලියලා ඒමට පුළුවන. එ බැවින් ඒවා ඉවත් කිරීම අවශ්‍ය නොවේ. එහෙත් සති 2කට පසු පරික්ෂා කර මියගිය අතු ඇත්නම් සැහැල්ලු ලෙස කොළ තට්ටුව ඉවත් කිරීමක් (Light skiffing) සිදු කළ හැක.
6. පසේ pH අගය පරික්ෂාවකින් පසුව අවශ්‍යනම් පමණක් ඩොලොමයිට් යෙදීම කළ හැක. (කෙසේ වෙතත් මෙම ඩොලොමයිට් යෙදීම තේ පඳුරු පුනර්වර්ධනය වූ පසු පොහොර දමා මාස 1 ½ කට පසු සිදු කළ යුතුය).

**3. අනුගමනය නොකළ යුතු දෑ:**

1. රසායනික පොහොර යෙදීම (යළි දළු ලියලා එනතුරු අත්හිටවිය යුතුයි).
2. දියර පොහොර යෙදීම.
3. පරිණත තේ පඳුරු පුනර්වර්ධනය වීමට පෙර කප්පාදු කිරීම (කප්පාදුවේ දී තේ පර්යේෂණ ආයතනයේ HP 1 උපදෙස් චක්‍රලේඛයේ දක්වා ඇති නිර්දේශයන් සැලකිල්ලට ගත යුතුය).
4. තේ පර්යෙෂණ ආයතනය නිර්දේශ නොකළ රසායනික ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය යෙදීම.

වැඩිදුර විස්තර සඳහා තේ පර්යේෂණ ආයතනයේ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න (081-22 44 777).

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**තලවාකැලේ**

**2025 දෙසැම්බර් 03**

**අයිතිය**

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශයේ කිසිදු කොටසක් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ/විධායක නිලධාරීගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, ස්කෑන් කිරීම හෝ තොරතුරු ගබඩා කිරීම සහ නැවත ලබා ගැනීමේ පද්ධති ඇතුළුව විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රම මඟින් පිටපත් කිරීම, ප්‍රති නිර්මාණය කිරීම හෝ සම්ප්‍රේෂණය කළ නොහැක.